සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**පළමු වාර ඇගයීම**
**முதலாம் தவணைமதிப்பீடு - 2018**
**First Term Evaluation**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 06 | |
| විෂයය / பாடம் / Subject | ක්‍රිස්තියානි ධර්මය | |
| පත්‍රය / வினாத்தாள் / Paper | I &II | |
| පැය / மணித்தியாலம் / Hours | 02 | |

- **උපදෙස් : සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න**
- **I පත්‍රය අංක 01 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

---

1) ආරම්භයේ පොළව තිබුණේ
1. ජලයෙන් පිරී ය 2. හිස්ව පාළුව ය 3. අන්ධකාරව ය 4. කඳු සහිතව ය

2) ශාස්ත්‍ර වන්තයින්ට ජේසුස් වහන්සේ බැලීමට ඒමට මඟ කියා දුන්නේ
1. ගව ඔරුව ය 2. තාරකාව ය 3. රජවරු ය 4. එඬේරු ය

3) උත්ථාන වූ ජේසුස් වහන්සේ කථා කරමින් ජෙරුසලම් ගමනට එක් වූයේ
1. ක්ලේයෝපස් සමඟය 2. ජොහාන් සමඟය 3. මතෙව් සමඟය 4. ඊසාක් සමඟය

4) ජුදෙව් පාස්කුව සැමරීමට අදාල විශේෂ අවස්ථාව මෙනෙහි කිරීම වන්නේ
1. අස්වැන්න මංගල්‍යයකි 2. උත්ථාන මංගල්‍යයකි 3. ආගමික මංගල්‍යයකි 4. දිවි පිදීමේ මංගල්‍යයකි

5) දේව මැවිල්ල තුළ ආහාර රැස් කිරීමට ක්‍රමවත්ව නිවාසය සකසන්නේ
1. මී මැස්සා ය 2. ගොළුබෙල්ලා ය 3. ගෙමැස්සා ය 4. පලගැටියා ය

6) සතියේ පළමු දින සොහොන වෙත ගිය කාන්තාවකි
1. සාරා 2. සුසානා 3. රෙබෙකා 4. මග්දලායේ මරියා

7) උන් වහන්සේගේ කුරුසිය මත සටහන් කල ප්‍රකාශය වන්නේ
1. ගැලවීමේ කුමාරයා 2. විමුකිත්යේ රජ
3. මොහු ජුදෙව්වන්ගේ රජ 4. ක්‍රිස්තුස් වහන්සේ

8) ජේසුස් වහන්සේගේ උත්ථානය තුල කිතුණු ජීවිතයට
1. බලාපොරොත්තුව ලැබිණි 2. පීඩාවක් ලැබිණි
3. දුගී බව ලැබිණි 4. අසරණ බව ලැබිණි

9) ජේසුස් වහන්සේ දෙමව්පියන් සමඟ පාස්කු සැමරීමට ජෙරුසලමට ගියේ
1. අවු : 10 දී 2. අවු : 12 දී 3. අවු : 14 දී 4. අවු : 18 දී

10) දවසක් උදා කිරීමට දේව පියා ලබා දුන්නේ,
1. චන්ද්‍රයා 2. සූර්යයා 3. තාරකා 4. ග්‍රහලෝක

11) ලොව මැවීමේදී ගොඩබිම මතුකර ජලය එක් රැස්කර නම් කළේ
1. පොළව හා මුහුද ලෙස ය 2. පොළව හා අහස ලෙස ය
3. ගොඩබිම හා ගංගා ලෙස ය 4. ගොඩබිම හා ජලාශ ලෙස ය

12) වෘක්ෂලතා මගින් දෙවි සමිඳුන් පරිසරයේ

1. පෝෂණය, සුවය හා සෙවණ සැලසීය 2. ජලාශ, සුවය හා නිරෝගී බව සැලසීය
3. සුවඳ, ආලෝකය හා රසය සැලසීය 4. තෘප්තිය, විශ්වාසය හා දිරිය සැලසීය

13) දේව පියා ඒදන් උයන රැකබලා ගැනීමට පදිංචි කළේ

1. සතුන්ව ය 2. කුරුල්ලන්ව ය 3. මිනිසාව ය 4. දරුවන්ව ය

14) ජේසුස් වහන්සේගේ උපත සඳහා මරියතුමිය තෝරාගත් බව දැනුම් දුන්නේ

1. එලිසබෙත් ය 2. ජෝසෙප් ය 3. දාවිත් ය 4. ගාබ්‍රියෙල් දේවදූතයා ය

15) සොහොන් ගෙය ළඟට දිව ගිය පේදුරු තුමා දුටුවේ

1. හණ රෙදි ය 2. දේවදූතයා ය 3. මෘත ශරීරය ය 4. සුවඳ ද්‍රව්‍ය ය

16) ජේසුස් වහන්සේගේ කුරුසිය උසුලාගෙන යෑමට උදව් වුයේ

1. මතෙව් ය 2. කිරේනියේ සීමොන් ය
3. සීමොන් පේදුරු ය 4. ජොහාන් මාක් ය

17) ''ජේසුස් වහන්සේ සැබවින්ම උත්ථාන වූ සේක'' මෙය ශ්‍රාවකයින්ට ප්‍රකාශ කලේ

1. ස්නාවක ජොහාන් තුමා ය 2. පේදුරු තුමා ය
3. සොහොනට ගිය කාන්තාවෝ ය 4. ජොහාන් මාක් තුමා ය

18) ''බීජ උපදවන ඵල දරන සියලු ගස් වර්ග මවනු ලැබුවේ කී වෙනි දිනයේ ද?

1. 5 වැනි දිනයේ දී ය 2. 8 වැනි දිනයේ දී ය
3. 6 වැනි දිනයේ දී ය 4. 3 වැනි දිනයේ දී ය

19) දේව දරුවන් ලෙස දේව මැවිල්ලේ දායාදයන්

1. විනාශ කළ යුතු ය 2. තම භාවිතයට පමණක් ගත යුතුය
3. අරපිරිමැස්මෙන් භාවිත කළ යුතු ය 4. මහිමය ගැන කථා කළ යුතු ය

20) ජේසුස් වහන්සේ අවසාන රාත්‍රි භෝජනයට බෙදා දෙනු ලැබුවේ,

1. රොටිය 2. පාන් හා මිදි යුෂය 3. රොටි හා මිදි යුෂය 4. මිදි යුෂය

## II කොටස

- **පළවෙනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න. පළවෙනි ප්‍රශ්නය අනිවාර්ය ය.**

01) I වාරයේ ඇගයීමක් යටතේ පන්තියේ දී ඔබ නිමකල බිත්ති පුවත්පත හෝ සඟරාවට සැකසූ ලිපි ඇසුරින් පිළිතුරු සපයන්න

1 ඒ සඳහා ඔබ කණ්ඩායමට ලැබුණු මාතෘකාව කුමක් ද?

2 එහි දී ජේසුස් වහන්සේගේ දෙමව්පියන් ඉටු කළ ජුදෙව් චාරිත්‍ර ලෙස දැක්වූයේ කුමක් ද?

3 එහි දී ඔබ කණ්ඩායම කරුණු සොයා ගැනීමට භාවිතා කළ මූලාශ්‍ර මොනවා ද?

4 පාස්කු මංගල්‍යය අවසාන වූ පසු ජේසුස් වහන්සේ කළ ක්‍රියාව කුමක් ද?

5 ජේසුස් වහන්සේ වැඩුණු ආකාරය බයිබලයේ දක්වා ඇති පාඨයක් ලියන්න.

6 මෙම ඇගයීම තුළින් ඔබ කණ්ඩායම ලද කුසලතාවයන් 02 ක් දක්වන්න.

7 එදිනෙදා ජීවිතයේ දේව සබඳතාව ක්‍රියා කිරීමට ගන්නා පියවර 02 ක් දක්වන්න.

8 ඉරු දින දහම් පාසලට යෑමෙන් ඔබ ලබන දේව ආශිර්වාද 02ක් දක්වන්න.

9 මෙම ඇගයීම සිදු කිරීමේ දී ඔබට ඇතිවූ ගැටළුවක් හා ගත් විසඳුම් දක්වන්න.

10 මෙම ඇගයීමට අදාල එක් සිදුවීමක් චිත්‍රයට නගන්න (ල 2 x 10 = 20)

02)

i ජේසුස් වහන්සේ කුරුසිය උසුලාගෙන ගියේ කුමන ස්ථානයට ද? (ල 02)

ii උන්වහන්සේ කුරුසිපත් කිරීමට එකල දායක වූ තිදෙනෙක් නම් කරන්න. (ල 03)

iii ජේසුස් වහන්සේ කුරුසියේ ජීවිතය පූජාකල අවස්ථාවට අදාළ වාක්‍ය 10ක් ලියන්න. (ල 05)

03)

i මැවිල්ලට පසු දෙවියන් වහන්සේ සෑම දිනකම දෙවියන් වහන්සේ තම මැවිල්ල ගැන දුටුවේ කුමක් ද? (ල 02)

ii මැවිල්ල තුළ දෙවියන් වහන්සේ අපට සපයා දී ඇති ආකාශ වස්තූන්ගෙන් ඉටු වන කාර්යයන් මොනවාද? (ල 03)

iii සත්ව ලෝකයේ විවිධ සතුන් පස් දෙනෙකු තෝරා ගෙන එම සතුන්ගෙන් ලබන ප්‍රයෝජන 01 බැගින් වගු ගත කරන්න (ල 05)

04)

i ජේසුස් වහන්සේගේ උපත දැනුම් දුන් ජන කොටස් 02 ක් නම් කරන්න (ල 02)

ii එක් කොටසක් දැක්වූ ප්‍රතිචාරයන් සඳහන් කරන්න (ල 03)

iii ඔබ නත්තල් ප්‍රීතිය බෙදා ගැනීමට කරන ක්‍රියාකාරකම් 05 ක් දක්වන්න (ල 03)

05)

i මැවිල්ලේ කාර්යේ දී සත් වන දින සම්බන්ධව පැවසුයේ කුමක් ද? (ල 02)

ii දින හයක් තුල දෙවියන් වහන්සේ මවන ලද දේ අනුපිළිවෙලින් දක්වන්න (ල 03)

iii දේව දරුවෙකු සේ පරිසරය සුරැකීමට ඔබ ඉටු කරන කාර්යයන් 05 ක් දක්වන්න (ල 05)

06)

i කිතුණු පාස්කුවේ අර්ථය කුමක් ද? (ල 02)

ii ජේසුස් වහන්සේ ගෝලයින් එකොලොස් දෙනා ඉදිරියේ ප්‍රකාශ වී පැවසූ පළමු වැකිය කුමක් ද?(ල 03)

iii එම්මාවුස් ගමනට ගිය එක් ගෝලයෙක් ඔබ යැයි සිතා තම මිතුරෙකුට / මිතුරියකට ලිපියකින් එය විස්තර කර යැවීම දක්වන්න

07)

I පහත සඳහන්මාතෘකාඅතරින් 02 ක් පිළිබඳවකෙටිසටහන් ලියන්න

1. දේවමැවිල්ල ආරක්ෂාකරමු
2. ජේසු බිළිඳාගේඋපත
3. දිවිපිදුජේසුස්වහන්සේ
4. දේවදරුවකු ලෙෂ ක්‍රියාකරමු

(ල 05)